ශීර්ෂය 280 - ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 280 - ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 ජූලි 25 ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024ට අනුව ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛන විධිවිධානවලට අනුකූල නොවීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 දෙසැම්බර් 16 දිනැති අංක 06/2024 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 3.1 ඡේදය ප්‍රකාරව නව CIGAS වෙබ් යෙදුම් පද්ධතියෙන් ලබාගත් අවසාන භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශන මූල්‍ය ප්‍රකාශනයට අමුණා තිබිය යුතු වුවත් SA-10, SA-11, SA-12,SA-30,SA-50,SA-51,SA-70,SA-80 සහ SA-90 යන මුද්‍රිත ඊට අමුණා නොතිබුණි.	මූල්‍ය ප්‍රකාශන පොත් 09 න් 06 ක් සඳහාම CIGAS වෙබ් යෙදුම් පද්ධතියෙන් ලබාගත් අවසාන භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශන ඇතුළත් කර ඇති අතර පොත් 03 ක් සඳහා පමණක් ඒවා ඇතුළත් කර නොතිබූ බවත් අදාළ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ ප්‍රකාශන යොමු කර ඇත.	රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කළ යුතු වීම
(ආ)	2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 6 ඡේදයට අනුව, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, මුදල් සහ හරස් සටහන් යන දෙකම සැලකිල්ලට ගෙන සෘජු ක්‍රමය භාවිතා කරමින් පිළියෙල කළයුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් මුදලින් ලද අත්තිකාරම් ලැබීම් සහ මුදලින් කල අත්තිකාරම් ගෙවීම් පමණක් සැලකිල්ලට ගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කර තිබුණි. ඒ අනුව, අත්තිකාරම් ලැබීම් හා අත්තිකාරම් ගෙවීම් රු.2,271,629 ක් බැගින් අඩුවෙන් දක්වා තිබීම හේතුවෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය හා මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය එම අගයෙන් අඩුවෙන් දක්වා තිබුණි.	අත්තිකාරම් “බී” ගිණුමේ හරස් සටහන් වටිනාකම රු. 2,058,119 ක් සහ අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරණ ආයතන විසින් අත්තිකාරම් “බී” ගිණුම වෙනුවෙන් කරන ලද හර කිරීම් රු213,510 ක් වන අතර, මෙම අගයන් දෙකෙහි එකතුව රු. 2,271,629 ක් වේ. ද්‍රවශීලතාවයක් නොමැති බැවින් මෙම මුදල මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි ඇතුළත් කර නොමැති නමුත් කාර්ය සාධන ප්‍රකාශයෙහි ඇතුළත් කර ඇත.	මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සම්බන්ධයෙන් වූ රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.

1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ) අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් ගිණුම්ගත කිරීමේදී පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	භාණ්ඩාගාර මුද්‍රිත සටහන් SA-52ට අනුව, 2024 වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ අත්තිකාරම් ලැබීම් රු.6,313,544ක් වුවද, එය රු.6,162,797ක් ලෙසත්, අත්තිකාරම් ගෙවීම් රු.6,187,120ක් වුවද, එය රු.6,036,373ක් ලෙසත් දක්වා තිබීම හේතුවෙන් එම අගයන් රු.150,747ක් බැගින් අඩුවෙන් දක්වා තිබුණි.	ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් රු. 150,747ක මුදලක් වැරදීමකින් මෙම දෙපාර්තමේන්තුව යටතේ ගිණුම්ගත වී ඇත. එය නිවැරදි කිරීම සඳහා මාරු පත්‍ර මගින් හර සහ බැර කිරීමේදී මෙම රු.150,747ක වෙනස දක්නට ලැබුණි	මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් SA 52 අනුව නිවැරදිව දැක්විය යුතු වීම.
(ii)	මූල්‍ය ප්‍රකාශය සමඟ ඉදිරිපත් කර තිබූ අත්තිකාරම් බී ගිණුම පිළිබඳ ප්‍රකාශය (ACA-5 ආකෘතිය) භාණ්ඩාගාර මුද්‍රිත සටහන් SA-52 හි සඳහන් වටිනාකම් සමග සැසඳීමේදී රු.150,747 වෙනසක් නිරීක්ෂණය වුණි.	වැරදි නිවැරදි කිරීම සඳහා හර සහ බැර කිරීමේදී මෙම වෙනස පෙන්වයි. නමුත්, SA 52 සහ ACA 5 ආකෘතියන්හි වටිනාකම් සමාන බව දන්වා තිබුණි.	මූල්‍ය ප්‍රකාශනවල අදාළ ආකෘතිප නිවැරදිව පිළියෙ කළ යුතු වීම.

(ආ) පුනරාවර්තන වියදම්

මූලධන වියදම් යටතේ වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම් යටතේ දැක්විය යුතු රු.212,400 ක වියදම මූලධන අත්පත් කර ගැනීම් ලෙස මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ දක්වා තිබුණි.	පිළිතුරු ලබා දී නොමැත.	මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් SA 52 අනුව නිවැරදිව දැක්විය යුතු වීම.

(ඇ) දේපල, පිරියත හා උපකරණ

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	පසුගිය වසරේ විගණිත මූල්‍ය ප්‍රකාශ අනුව එම වර්ෂය අවසානයේ මූල්‍ය නොවන වත්කම්වල අගය රු.64,604,642 ක් ලෙස දක්වා තිබුණද, සමාලෝචිත වර්ෂයේ ඊට අනුරූපී ආරම්භක ශේෂය ශුන්‍ය අගයක් ලෙස දක්වා තිබුණි.	ඒකාබද්ධ රජයේ ගිණුම්කරණ පද්ධතියේ (CIGAS) තාක්‍ෂණික දෝෂයක් මත වර්ෂයේ ආරම්භක ශේෂය ශුන්‍ය අගයක් ලෙස පෙන්වා ඇති අතර එය දෙපාර්තමේන්තුවේ පාලනයෙන් බැහැර තත්ත්වයකි.	මූල්‍ය නොවන වත්කම්වල ආරම්භක ශේෂය නිවැරදිව ගිණුම්ගත කළ යුතු වීම.

(ii)	සමාලෝචිත වර්ෂය තුළදී මිලදී ගෙන තිබූ එකතුව රු.27,411 ක් වූ වත්කම් සහ වෙනත් ආයතන විසින් දෙපාර්තමේන්තුව වෙත භාර දී තිබූ එකතුව රු.582,017 ක් වූ වත්කම්, මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයේ මිලදී ගැනීම් සහ පවරාදීම් (Transfer in) ලෙස දක්වනු වෙනුවට, ඉහත වත්කම්වල එකතුව වූ රු.609,428 ආරම්භක ශේෂයට එකතුකල වටිනාකම් ලෙස දක්වා තිබුණි.	සියළු වත්කම් පවරා ගැනීම් Open Balance ලෙස වත්කම් ප්‍රකාශනයෙහි දක්වා ඇති අතර, අදාළ වටිනාකම්ද සමඟ ඇතුළත් කර ඇත. ඉදිරියේදී එම වත්කම් Transfer In ලෙස ඇතුළත් කිරීමට කටයුතු කරනු ඇත.	වත්කම් මිළදී ගැනීම හා පවරා දීම නිවැරදිව ගිණුම්ගත කළ යුතු වීම.
(iii)	කාලච්ඡේදය තුළ දෙපාර්තමේන්තුව විසින් පවරාගත් හා පවරාදෙනු ලැබූ එක් එක් අයිතමවල වටිනාකම් වත්කම් පවරා ගැනීම් පත්‍රිකාවල විධිමත් ආකාරයට වාර්තාකර නොතිබුණි. ඒ අනුව, පවරාගත් අයිතම් 09 න් අයිතම 07 ක සහ පවරා දුන් අයිතම 8කින් 07 ක වටිනාකම් පවරාදීම් පත්‍රිකාවල සඳහන් කර නොතිබුණි.	මෙම දෙපාර්තමේන්තුව වෙත පවරා ගත් අයිතමයන්හි වටිනාකම පවරාදීම් පත්‍රිකාවල සඳහන්ව නොමැති නමුත් ආවරණ ලිපිය මඟින් දන්වා එවා ඇත. ඉදිරියේදී භාණ්ඩ පවරා දීමේදී වටිනාකම සඳහන් කිරීමට කටයුතු කරනු ඇත.	පවරාදුන් හා පවරාගත් වත්කම්වල අගයන් පවරාදීම් හා පවරාගත් පත්‍රිකාවල විධිමත් ආකාරයට වාර්තා කළ යුතු වීම.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව

(අ) විගණනය වෙත ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පහත සඳහන් විගණන නිරීක්ෂණය අනුව, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ අනුරූපී වී නොතිබුණි.

විගණන නිරීක්ෂණ	**මෙම වාර්තාවේ ඡේදයට යොමුව**
ඉකුත් වර්ෂයේ මූල්‍ය නොවන වත්කම්වල අගය රු.64,604,642 ක් වූවත්, සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය ශුන්‍ය අගයක් ලෙස දක්වා තිබුණි.	1.6.2 ඇ (i)

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වැය විෂයයන් 4 සම්බන්ධයෙන් ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් එකතුව වූ රු.5,500,000 කින් රු.3,984,978 ක් උපයෝජනය කිරීමකින් තොරව ඉතිරි වී පැවතුණි. එය එම වැය විෂයයන්ගේ ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් සියයට 57ත් සියයට 89ත් අතර පරාසයක පැවතුනි.	මුදල් අමාත්‍යාංශය මඟින් නිකුත් කල වියදම් පාලන චක්‍රලේඛය හා ජනාධිපති කාර්යාලය විසින් ඉදිරිපත් කරන ලද වියදම් කළමනාකරණ චක්‍රලේඛය පරිදි, මෙම දෙපාර්තමේන්තුවේ වියදම් කළමනාකරණය හේතුවෙන් ඇස්තමේන්තු ප්‍රතිපාදනයට වඩා අඩු ප්‍රතිපාදන ප්‍රමාණයක් භාවිතා කිරීම නිසා ඉතිරි වී ඇත. මෘදුකාංග වැඩිදියුණු කිරීම (software Development) සඳහා ඇස්තමේන්තුගත කර ඇතත් එම මෘදුකාංගය සකස් කර නොමැති බැවින් ද එම ප්‍රතිපාදනයෙන් 89% ක ඉතිරියක් පෙන්නුම් කර ඇත.	මු.රෙ 50 විධිවිධාන ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කළ යුතු වීම.
(ආ)	ප්‍රමාණවත් පරිදි ප්‍රතිපාදන වෙන් කරවා ගැනීමෙන් තොරව මූලික ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය වූ රු.450,000 ට අමතරව රු.100,000 මු.රෙ. 66 මඟින් ප්‍රතිපාදන ලබා ගෙන තිබුණි. එම මාරු කර ගත් මුළු ප්‍රතිපාදනයම එනම් 100%ක් උපයෝජනය නොකර ඉතිරිව පැවතුණි.	වර්ෂය අවසානයේ සංචිත වාහන සඳහා සිදුකරන ලද ඉන්ධන පරීක්ෂාව හා අමාත්‍යාංශය විසින් නඩත්තු කරන ලද වායු සමීකරණ මෙම දෙපාර්තමේන්තුව යටතේ නඩත්තු කිරීමට සිදුවීම නිසා අදාළ සේවා ගිවිසුම් වලට එළඹීමට සිදුවීම හේතුවෙන් ප්‍රතිපාදන මාරු කිරිමට සිදුවිය. අයවැය දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද වියදම් පාලන චක්‍රලේඛය පරිදි වියදම් කළමනාකරණය හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි වි ඇත.	-එම-

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 සැලසුම් කිරිම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
දෙපාර්තමේන්තුව විසින් 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදයේ සඳහන් මාර්ගෝපදේශයේ දැක්වෙන ආකෘතිය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර	රා.මු.ච 2/2020 චක්‍රලේඛයේ 03 ඡේදයේ සහ එම දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ දක්වා ඇති ආදර්ශ ආකෘතිය පරිදි ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර ඇති බව ද, 2024	රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරිම හා

නොතිබුණි. දෙපාර්තමේන්තුව විසින් සකස් කර තිබූ සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මෙහි හා ප්‍රගති වාර්තාවේ දත්තවල නිරූපණය කිරීමේ පරස්පරතාවයන් නිරීක්ෂණය වූ අතර, 2024 වර්ෂයේ ක්‍රියාකාරකම්වල අපේක්ෂිත භෞතික ඉලක්ක හා ළඟාකර ගත් ඉලක්කය සංඛ්‍යාත්මව නිරූපණය වන ආකරයට එහි ප්‍රගති වාර්තාව සකස්කර නොතිබුණි.	වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලැස්මේ සහ එහි කාර්තුමය ප්‍රගති වාර්තාවේ දත්ත නිරූපණය කිරීමේදී ප්‍රතිශතාත්මක වශයෙන් දක්වා ඇතත්, ඇතැම් ස්ථානවල සංඛ්‍යාත්මක දත්ත යොදාගෙන තිබුණි. එමෙන්ම, ප්‍රගති වාර්තාවෙහි ඇතැම් ක්‍රියාකාරකම්වල සංඛ්යාත්මක දත්ත නිරූපණය ඵලදායී නොවන අවස්ථාවල උදාහරණ වශයෙන් පාලන හා ගිණුම් අංශවලට අදාළ අංක 06 සිට 08 දක්වා වූ ක්‍රියාකාරකම් සම්බන්ධව ප්‍රතිශතාත්මකව හා වඩා සුදුසු පරිදි ප්‍රගතිය නිරූපණය කර ඇත.	ක්‍රියාකාරී සැලැස්ම සංසන්දනය කළ හැකි ආකාරයට ප්‍රගති වාර්තාව සකස් කළ යුතු වීම.

4.2 කාර්යභාරයන් ඉටු කිරීමේ ප්‍රගතිය

	විගණන නිරීක්ෂණය	ගණකාධිකාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ විවිධ රේඛීය අමාත්‍යාංශ යටතේ ක්‍රියාත්මක වූ විශාල සහ මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘති 226 ක් ව පැවති අතර, ඒ අතරින් ව්‍යාපෘති 120 ක් දේශීය අරමුදල් හා ණය මඟින් ද, ව්‍යාපෘති 106 ක් විදේශීය ණය හා ප්‍රදාන මඟින් ද මූල්‍යනය කර තිබුණි. කෙසේ වුවද සමාලෝචිත වර්ෂයේදී නිම කිරීමට නියමිතව තිබූ ව්‍යාපෘති 110 ක් අතරින් ව්‍යාපෘති 23 ක් පමණක් අවසන් කර තිබූ අතර, වර්ෂ අවසානය වන විට කාර්යසාධන ගැටළු හේතුවෙන් ව්‍යාපෘති 02 ක් අත්හිටුවා තිබුණු අතර ව්‍යාපෘති 85 ක් අපේක්ෂිත පරිදි නිම කිරීමට නොහැකි වී තිබුණි. එසේම, 2024 වර්ෂයදී මෙම ව්‍යාපෘති සඳහා දළ වශයෙන් රු.බිලියන 705 ක් ප්‍රතිපාදනය වෙන්කර තිබුණද, වර්ෂය අවසාන වන විට රු. බිලියන 402 ක් පමණක් හෙවත් ප්‍රතිපාදනයෙන් සියයට 57 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව, අපේක්ෂිත සංවර්ධන ප්‍රතිඵල ජනනය ඉහළ නැංවීම සඳහා වූ දෙපාර්තමේන්තුවේ අරමුණු අපේක්ෂිත පරිදි සම්පූර්ණයෙන් ඉටුකරගත හැකිවන ලෙස එම කටයුතු මෙහෙයවීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබූ බව නිරීක්ෂණය විය.	මෙම දෙපාර්තමේන්තුව මගින් විශාල හා මහා පරිමාණ ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය මාසිකව සමාලෝචනය කරන අතර, කාර්තුමය වශයෙන් එම ප්‍රගතිය හා ගැටළු සම්බන්ධව අමාත්‍ය මණ්ඩලය දැනුවත් කරනු ලබයි. අමාත්‍ය මණ්ඩලය මගින් ඒ සඳහා දෙනු ලබන තීරණය රේඛීය අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත දැනුම් දෙනු ලබන අතර, දෙපාර්තමේන්තුව විසින් හඳුනාගනු ලබන හා රේඛීය අමාත්‍යාංශ විසින් ඉදිරිපත් කරනු ලබන ගැටළු විසඳීම සඳහා එම ගැටළු ජාතික මෙහෙයුම් මැදිරිය වෙත යොමු කිරීමද මෙම දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන අතර, අදාළ පහසුකම් ප්‍රයෝජනයට ගෙන, ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය අපේක්ෂිත ඉලක්ක අනුව අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය අමාත්‍යාංශ ලේකම්වරයාගේ වගකීමක් වේ. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ වගකීම රේඛීය අමාත්‍යාංශ වෙත පැවරී ඇති අතර මෙම දෙපාර්තමේන්තුව මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සමීපව අධීක්ෂණය කරනු ලබයි.	සම්පත් ප්‍රශස්ථ ලෙස භාවිතා කර එකඟ වූ කාල රාමුව හා පිරිවැය තුළ අපේක්ෂිත සංවර්ධන ප්‍රතිඵල අත් කර ගැනීමට කටයුතු කළ යුතු වීම.

(ආ)	සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව අනුව වර්ෂය තුළ ව්‍යාපෘති ක්ෂේත්‍ර චාරිකා පරීක්ෂණ 79 ක් ඉලක්කකර තිබුණද, ව්‍යාපෘති 41 ක් පමණක් ආවරණය කර තිබුණි.	පිළිතුරු ලබා දි නොමැත.	අපේක්ෂිත පරිදි ක්ෂේත්‍ර චාරිකා පරීක්ෂණ කිරීම

4.3 ප්‍රසම්පාදනයන්

(අ) ප්‍රසම්පාදන සැලසුම්කිරීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව, ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 10 දිනට පෙර සකස් කොට ඒ සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අනුමැතිය ලබා ගත යුතු වුවත්, 2024 වර්ෂයට අදාල ප්‍රසම්පාදන සැලැස්ම නියමිත කාලය තුළ සකස්කර අනුමැතිය ලබාගෙන නොතිබුණි. තවද, පිළියෙලකරන ලද සැලස්මට අදාල ප්‍රගතිය විගණනය වෙත වාර්තාකර නොතිබුණි.	2024 වර්ෂයට අදාල ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාගේ අනුමැතිය ලබා ගැනීමට ප්‍රමාද වි ඇත.	රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කළ යුතු වීම.
(ii)	මෘදුකාංග සංවර්ධනයට රු.2,000,000 ක් හා මෘදුකාංග නඩත්තුව සඳහා රු.2,000,000 ක් ලෙස එකතුව රු.4,000,000 ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ලෙස වෙන්කර තිබුණද, එය සමාලෝචිත වර්ෂයේදී ප්‍රසම්පාදන සැලසුමට ඇතුලත් කර නොතිබුණි.	විදේශ ආධාර යටතේ අප දෙපාර්තමේන්තුව මගින් තොරතුරු පද්ධතියක් සකස් කිරීමට අපේක්‍ෂා කළ බැවින්, මෘදුකාංග සංවර්ධනය සහ නඩත්තුව සඳහා ප්‍රතිපාදන වෙන්කරන ලදි. නමුත් එය ක්‍රියාත්මක නොවීම හේතුවෙන් එය ප්‍රසම්පාදන සැලසුමට ඇතුළත් කර නොමැති අතර මුළු ප්‍රතිපාදනයම උපයෝජනය නොකර ඉතිරි වි ඇත	සියළුම ප්‍රසම්පාදනයන්, ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කළ යුතු වීම.
(iii)	මෘදුකාංග සංවර්ධනය සඳහා ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් සියයට 89 ක් හා මෘදුකාංග නඩත්තුව සඳහා ඇස්තමේන්තුගත මුළු ප්‍රතිපාදනයම උපයෝජනය නොකර ඉතිරි වී පැවතුණි.		ප්‍රතිපාදන,උපරිම අයුරින් කාර්යක්ෂම ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු වීම.

(ආ) විද්‍යුත් ප්‍රසම්පාදනය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
රාජ්‍ය ආයතන වෙත රාජ්‍ය විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය හඳුන්වා දීම පිළිබඳව වූ 2018 ඔක්තෝබර් 23 දිනැති අංක 05/2018 හා 2019 දෙසැම්බර් 17 දිනැති අංක 08/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව, රාජ්‍ය ප්‍රසම්පාදන අස්ථිත්ව ලියාපදිංචිය, සම්බන්ධීකරණ නිලධාරීන් ලියාපදිංචිය, සැපයුම්කරුවන් ලියාපදිංචිය, වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ඉදිරිපත් කිරීම, ප්‍රසම්පාදන දැන්වීම් ප්‍රසිද්ධ කිරීම, මිල සැඳහුම් ක්‍රමයට විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය භාවිතා කිරීම ආදී කටයුතු සියලු රාජ්‍ය ආයතන විසින් සිදු කළ යුතු බව දක්වා තිබුණද, ඊට පටහැනිව, සමාලෝචිත වර්ෂය තුළදී රු.1,449,546 ක් වටිනා ටයර් සහ බැටරි මිල සැඳහුම් ක්‍රමයට සපයාගෙන තිබුණි.	මිල සැඳහුම් ක්‍රමයට ටයර් සහ බැටරි පමණක් 2024 වර්ෂය තුල මිලදී ගෙන ඇති අතර ඉදිරි වර්ෂයේදී විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය වාහන සඳහාද අදාල කිරීමට කටයුතු කරයි.	චක්‍රලේඛය ප්‍රකාරව, විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය භාවිතා කර ප්‍රසම්පාදනයන් කල යුතු වීම.

4.4 අනාර්ථික ගනුදෙනු

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
දෙපාර්තමේන්තුවේ මූලික කාර්යභාරය වන ව්‍යාපෘති ප්‍රගති අධීක්ෂණය හා කළමණාකරණ සඳහා අත්‍යවශ්‍ය දත්ත රැස්කිරීමේ හා ඇගයීමේ ප්‍රධාන මාධ්‍යක් ලෙසට භාවිතා කිරීම සඳහා ජාතික සංවර්ධන තොරතුරු පද්ධතිය (NDIS) සඳහා නව තාක්ෂණය යොදා ගනිමින් වෙබ් පදනම් කර ගත් ව්‍යාපෘති අධීක්ෂණ පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා, 2021 වර්ෂයේදී විවෘත මිල කැඳවා බදු සහිත රු.135,720,000 ක කොන්ත්‍රාත් වටිනාකමකට සමාගමක් වෙත කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය හේතුවෙන් 2022 අගෝස්තු 31 දින මෙම කොන්ත්‍රාත්තුව අත්හිටුවා තිබුණු අතර, 2024 දෙසැම්බර් 31 දින වනවිටත්, අදාල තොරතුරු පද්ධතිය නවීකරණය කර ගැනීමට	JICA ආධාර යටතේ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව මගින් නව තොරතුරු පද්ධතියක් සකස් කිරීම ආරම්භ කර ඇති අතර එහි තොරතුරු පදනම් කර ගනිමින් ව්‍යාපෘති අධීක්ෂණය සඳහාද තොරතුරු පද්ධතියක් ආරම්භ කිරීමට මේවන විට සාකච්ඡා කරමින් පවතී. ඒ අනුව මෙම තොරතුරු පද්ධතිය ක්‍රියාත්මක කිරීම මගින් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව, අයවැය දෙපාර්තමේන්තුව, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සහ ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව යන	ජාතික සංවර්ධනය තොරතුරු පද්ධතිය කඩිනමින් සකසා ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතු වීම.

අපොහොසත්වී තිබුණි. ඒ අනුව, ව්‍යාපෘති කළමණාකරණයේදී ඒවා සමාලෝචනය, වාර්තා කිරීම, සම්බන්ධීකරණය, ක්‍රියාත්මක කිරීම වැනි අවස්ථාවලදී මතුවන ගැටළු නිරාකරණය හා සම්බන්ධීකරණය අවම කාර්යක්ෂමතාවයකින් යුතුව ක්‍රියාත්මක වන බවට නිරීක්ෂණය කෙරේ.	දෙපාර්තමේන්තු 04 සඳහාම ප්‍රතිලාභ ලබා ගැනීමට හැකියාව ලැබේ.

4.5 කළමනාකරණ දුර්වලතා

රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම

විගණන නිරීක්ෂණය	**ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 4.5 හා 4.6 වගන්ති ප්‍රකාරව සේවය අතහැර ගිය නිලධාරීන්ගේ ණය ශේෂ අයකර ගැනීම සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වුවද, දෙපාර්තමේන්තුවේ සේවය අතහැර ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු වසර 9 ක් පැරණි රු.139,921 ක් වූ ණය ශේෂය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් වී නොතිබුණි.	මෙම නිලධාරියා සේවා අකාර්යක්ෂමතාවය මත විශ්‍රාම ගැන්වීමට රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් විසින් 2024.09.02 දිනැති ලිපිය මඟින් එකඟතාවය දී ඇත. ඒ අනුව, මෙම වසර අවසාන වීමට ප්‍රථම නිලධාරියාගෙන් අයවිය යුතු ණය ශේෂ අයකර ගත හැකි ය.	ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම

5 තිරසර සංවර්ධන අරමුණු ඉටු කිරීමේ ප්‍රගතිය

තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම සඳහා රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතීන් හා වැඩසටහන්වල අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කර ගැනීමේ ප්‍රගතීන් අධීක්ෂණය හා ඇඟයීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් හඳුනාගෙන තිබූ කාර්යභාරයන්හි ප්‍රගතිය පිළිබඳ පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

	විගණන නිරීක්ෂණය	**ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	වෙබ් පාදක ජාතික සංවර්ධන තොරතුරු පද්ධතිය ක්‍රියාත්මක තත්ත්වයේ නොපවතින බැවින්, දෙපාර්තමේන්තුව විසින් හඳුනාගෙන තිබූ පහත සඳහන් තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ ජයග්‍රහණ දර්ශක 03 ක්	දැනට ක්‍රියාත්මක විශාල හා මහා පරිමාණ ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය කාර්තුමය වශයෙන් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබීමෙන් පසු දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ පළ කරන බැවින්, ඒම	වෙබ්පාදක ජාතික සංවර්ධන තොරතුරු පද්ධතිය ක්‍රියාකාරී තත්ත්වයට පත්කර ගත යුතු වීම සහ දෙපාර්තමේන්තුවට අදාල වන පරිදි තිරසර

සම්බන්ධව කිසිදු ප්‍රගතියක් ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

(i) වෙබ් පාදක ජාතික සංවර්ධන තොරතුරු පද්ධතිය සඳහා ප්‍රවේශ වූ පාර්ශවකරුවන් ගණන

(ii) වෙබ් පාදක ජාතික සංවර්ධන තොරතුරු පද්ධතිය ප්‍රවේශයට සිදුවූ අවහිරතා පිළිබඳ වාර්තා වීම්

(iii) වෙබ් පාදක ජාතික සංවර්ධන තොරතුරු පද්ධතියට නියමිත අවස්ථාවේදී ප්‍රවේශ වීමට සිදුවූ අවහිරතා පිළිබඳ වාර්තාවීම්

(ආ) දෙපාර්තමේන්තුව විසින් ඉටු කළ යුතු හා පහසුකම් සැලසිය යුතු පහත සඳහන් තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ ජයග්‍රහණ දර්ශක 03 හි අරමුණු ළඟා වීම සියයට 50 කට වඩා අඩු මට්ටමක පැවතුණි.

(i) ඇගයීම් අනාවරණයන් සඳහා පහසු ප්‍රවේශය

(ii) සංවර්ධන පාර්ශවකරුවන් සමඟ පැවැත්වූ ඒකාබද්ධ ව්‍යාපෘති සමාලෝචන සංඛ්‍යාව

(iii) සංවර්ධන පාර්ශවකරුවන් සතු තොරතුරු සඳහා ප්‍රවේශය

තොරතුරු සඳහා ඕනෑම පාර්ශවකරුවකුට ප්‍රවේශ වී අවශ්‍ය තොරතුරු ලබා ගැනීමේ හැකියාව පවතී. JICA ආධාර යටතේ ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව මගින් නව තොරතුරු පද්ධතියක් සකස් කිරීම ආරම්භ කර ඇති අතර එහි තොරතුරු පදනම් කර ගනිමින් ව්‍යාපෘති අධීක්ෂණය සඳහාද තොරතුරු පද්ධතියක් ආරම්භ කිරීමට මේවන විට සාකච්ඡා කරමින් පවතී. දැනට නියමු ඇගයීම් දෙකක් සිදු කර ඇති අතර, වෙබ් පාදක ජාතික සංවර්ධන තොරතුරු පද්ධතිය ස්ථාපිත කරන තෙක් ඇගයීම් අනාවරණයන් දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පළ කිරීමට කටයුතු සූදානම් කර ඇත. අපේක්ෂා කළ සංවර්ධන පාර්ශවකරුවන් 06 අතුරින් ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව, එක්සත් ජාතීන්ගේ සංවිධානය, ජාත්‍යන්තර සංවර්ධන සඳහා වූ එක්සත් ජනපද ඒජන්සිය හා යුරෝපා සංගමය පමණක් 2024 වර්ෂය තුළ ඒකාබද්ධ ව්‍යාපෘති සමාලෝචනය කිරීම සඳහා එකඟතාවය පළකල බැවින් 50% ක ප්‍රගතියක් අත්කර ගැනීමට හැකිව ඇත.

සංවර්ධන අරමුණු සපුරා ගැනීමට කටයුතු කළ යුතු වීම.

6. මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම	නිර්දේශය
දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු 101 න් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය කෙරෙහි ඍජු බලපෑමක් සහිත ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 10 ක්ද ඇතුළුව තනතුරු 34 ක් හෙවත් සියයට 34 ක පුරප්පාඩු පැවතිණි. එසේ වුවද, අදාල පුරප්පාඩු තනතුර පුරවා ගැනීමට හෝ අවශ්‍යතාවයට අනුව, අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කරවා ගැනීමට දෙපාර්තමේන්තුව විධිමත් පියවර ගෙන නොතිබුණි.	පවතින පුරප්පාඩු සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය දැනුවත් කර ඇත.	පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු වීම.